**භාරත කිරි සමූපකාර නිෂ්පාදනයේ හා අලෙවියේ මුළු අයිතිය සුළු කිරි නිෂ්පාදකයන් වෙතම පැවරෙන අයුරින් සකස්ව ඇත. භාරතයට කිරි ඉතිරවූ මෙම සුළු ගොවි සමූපකාර කිරට අඩන ශ්‍රී ලංකාවටත් කදිම ආදර්ශයක් වනවාට කිසිදු සැකයක් නැත.**

නව සැළැස්ම කොතරම් සාර්ථකව ක්‍රියාත්මක වුනාද කිවහොත් වසර කිහිපයකදී කිරිපිටි ගැන එතෙරට අතපෑම වළකා ගන්න භාරතයට හැකි වුනා. මන්දපෝෂණයෙන් පෙළෙන ජනතාවට දිනපතා කිරි ලීටර තිස් ලක්ෂයක් ලැබුණා. කිරි කම්හල්වලට එකතු වෙන කිරි වැඩි වීම නිසා කිරිපිටි, ගිතෙල්, බටර්, චොකලට්, බීම වර්ග වැනි අතුරු නිෂ්පාදන රැසක් නිපදවුනා. මද්‍රාසි ප්‍රාන්තයේ ඇතැම් ප්‍රදේශවල කිරි එකතු කිරීම සතියකට දින කිහිපයකට සීමා කරන්න වුනෙත් කිරි නිෂ්පාදනය වැඩිවීම නිසයි.

# භාරතයේ "සුදු" විප්ලවය

ලෝකයේ මී හරකුන්ගෙන් 97% ක් ආසියාවේ. එළ හරකුන්ගෙන් 13% ක් ආසියාවේ ඒත් ආසියාවෙන් ලෝක කිරි සැපයුමට එකතු වන්නේ 13% ක් පමණයි. ආසියාවට අවශ්‍ය කිරි නිෂ්පාදන වලින් වැඩි හරියක් එන්නේ නවසීලන්තය, ඕස්ට්‍රේලියාව හා යුරෝපා රට වලින්.

මේ තත්වය මගහැර ආසියාවේ කිරි නිෂ්පාදනය වැඩි කිරිමට ගතයුතු පියවර ගැන සාකච්ඡා කෙරුණු පුහුණු වැඩ කම්හලක් මේ මාසයේ ගුජරාට් ප්‍රදේශයේ ආනන්ද් නගරයේදී පැවැත් වුනා. සත්ව පාලනය හා සෞඛ්‍ය කටයුතු පිළිබඳ ආසියානු කොමිසම හා ඉන්දීය ජාතික කිරිපට්ටි සංවර්ධන මණ්ඩලයයි මෙම වැඩහල සංවිධානය කළේ.

භාරතයේ දහසකුත් එකක් නගර වලින් ආනන්ද් නගරයම මේ සඳහා මධ්‍යස්ථානය වුයේ ඇයි? ඉතා සුළුවෙන් ඇරඹුණු කයිරා කිරි සමිතියේ මධ්‍යස්ථානය ආනන්ද් නගරය වීමයි ඊට හේතුව. ආසියාවේ ඉතාමත් හොඳින් සංවිධානය වූ සාර්ථක කිරි නිෂ්පාදන සංවිධානය වන කයිරා සමිතියට උපහාර ලෙසිනුයි මෙය එහිදී පැවැත්වුනේ (24 පිටුවෙ විස්තරය බලන්න).

කයිරා සමිතිය ආදර්ශයට ගනිමින් ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමෙ නව සැළැස්මක් 1970 දී භාරතයේ ක්‍රියාත්මක වුනා. එය සූරා කෑම්වලට නිතොරවම පහසුවෙන් ගොදුරු වෙන, ගම්බද ගොවියන්ට කිරි නිෂ්පාදනයේ හා අලෙවි කිරීමේ සම්පූර්ණ ආධිපත්‍යය පැවරෙන ලෙස සකස් වූවක්. ගොවි ජනතාවගේ නිෂ්පාදනවල මිළ නගරයේ පොහොසතුන්ගේ මනාපයට නොව ගොවි ජනතාව විසින්ම තීරණය කෙරෙන පදනමක් මේ සැලැස්ම නිසා සකස් වුනා.

ජාතික කිරි නිෂ්පාදනය වැඩි කළ මේ සැළැස්ම ක්‍රියාත්මක කළ අයුරු ශ්‍රී ලංකාවටත් ආදර්ශයක් වනු නිසැකයි. ඉන්දීය ජාතික කිරි නිෂ්පාදන මණ්ඩලය දූර දක්නා නුවනින් වැඩෙට අත ගැහුවා. මුල් ප්‍රශ්නය මූලික ධනය හොයා ගැනීමයි. ලෝක ආහාර සැළැස්මෙන් ආධාර වශයෙන් කිරි පිටි හා බටර් තෙල් ලැබුණා. මෙවා අලෙවියෙන් ලැබුන ඩොලර් කෝටි පහළොවක් මූලික ධනය වුනා. බොම්බාය, දිල්ලිය හා කල්කටා යන නගරවල තිබුණ කිරි කම්හල් දිනකට කිරි ලීටර භාර ලක්‍ෂයක් බාර ගත හැකි තත්වයට ප්‍රතිසංවිධානය කළා. මද්‍රාසි කම්හල ලීටර දෙලක්‍ෂයක් බාර ගත හැකි තත්වයට ගෙනවා.

මේ අතර දිස්ත්‍රික්ක දහ අටක කිරි එකතු කිරීමේ සැළැස්මක් ක්‍රියාත්මක වුනා. කිරි ශීතකර කල්තබා ගැනීමේ කම්හල් ඉතා වැදගත ස්ථානවල ඉදිකළා කිරි පහසුවෙන් බෙද හැරීමට මෙය ප්‍රයෝජනවත් වුනා.

මූලික සැලැස්ම මෙසේ සකස් වෙද්දි කිරි මණ්ඩලයේ උපදේශකයන් හා විශේෂඥයන් ගම්මානවලට ගියා. කයිරා සමිතියට අනුකූලව කිරි නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිති, සැලැස්මෙ ඉලක්ක පෙදෙස්වල පිහිටවනු ලැබුවා.

භාරතයේ වැයම උනන්දුවෙන් බලා සිටි එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, කිරි ටැංකි හද ගන්න වානේ ටොන් 240 ක් හා පැයකට කිරි බෝතල 12,000 ක්, 24 000 ත් අතර පිරවිය හැකි කම්හල් දහයක් පිරිනැමුවා. ලෝක බැංකුව සැලැස්මේ ප්‍රදේශ දෙළහක් සංවර්ධනය කිරීමට තෝරා ගත්තා.

1977 අවසානයේදී භාරතයේ කිරි නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිති ගණන පන්දහස් ඉක්මවූවා. සාමාජික සංඛ්‍යාව පන් ලක්ෂයක්. නව සමිති රටාව නිසා කිරි නිෂ්පාදනයේ ඇතිවූ ප්‍රගතියට උදහරණයකි, බොම්බාය. වසර ගණනාවක්ම බොම්බායට අවශ්‍ය කිරි වැඩි ප්‍රමාණය ලැබුනේ ගුජරාටි ප්‍රාන්තයෙන්. තමන්ට අවශ්‍ය කිරි තම ප්‍රදේශ වලින් ලබාගත හැකි වේයැයි මහරාෂ්ට්‍ර නිලධාරීන් හීනෙකින්වත් හිතුවේ නැහැ. 1974 දිනක කිරි එකතුව ලීටර 2,90,000 යි. 1977 ලීටර 5,80,000 යි. කිරි නිෂ්පාදක සමිති කළ පෙරළිය නිසා තවත් විශාල කිරි කම්හල් දෙකක් ඉදිවෙමින් පවතිනවා.

මද්‍රාසියට දිනකට අවශ්‍ය කිරිලීටර 1,45,000 යි. දැන් දිනක එකතුව ලීටර 1,80,000 ක්. කිරි එකතු කිරීමේ හා ඇසිරීමේ සේවා පුළුල් නොකළහොත් ගම්මානවල කිරි අපතේ යා හැකි තත්වයක් උදවෙලා. කිරි ශීත කිරීමේ කම්හල් තම කිරි නොගන්නා බවට මද්‍රාසි නිෂ්පාදක සමිති දැන් පැමිණිලි කරන්නට අරන්.

ගම්මානවල නිෂ්පාදනය වැඩි කරන අතරම ඒ සඳහා නාගරික වෙළඳපල අල්ලා ගැනීමේ උපායශීලී ප්‍රතිපත්තිය යටතේ තම සැලැස්ම ක්‍රියාත්මක කළේ, අහිංසක ගැමි ගොවියන් ඔවුන්ගේ ජීවොනෝපායේ ස්වාමියන් කිරීමේ මහඟු අරමුණින් බව ඉන්දීය කිරි මණ්ඩලයේ සභාපති ආචාර්ය කුරියන් පවසනවා. කිරි නිෂ්පාදක සමිති සාමාජිකයන් පන් ලක්ෂයෙන් 60% ක් සුළු ගොවියන් හා ඉඩම් නොමැති කම්කරුවන් වීම මෙහි ආර්ථිකමය වටිනාකම තවත් වැඩි කරන්නක්. මොවුන්ගේ පවුල්වල දළ ආදායමෙන් හතරෙන් තුනක්ම කිරි වලින් ලැබෙන බවත් අමතක නොකළයුතු බව ඔහු පවසනවා.

භාරතයට කිරි ඉතිරවූ නව කිරි සැලැස්ම කොතරම් හොඳින් ක්‍රියාත්මක වීද යන්නට සාධක ලැබෙන්නේ එතෙරින් ඉන්දීය ජාතික කිරිපට්ටි සංවර්ධන මණ්ඩලය කිරි පිළිබඳව ලෝක බැංකුවේ උපදේශකයෙක් ලෙස පත් කරලා. මේ හැර විදෙස් සැලසුම් 84 ක් භාර ගන්නා ලෙසට ඇරයුම් ලැබිලා. මේ සම්මානනීය තත්වයට හිමිපෙත්ත වුනේ කිරි නිපදවන සුළු ගොවියන්ගේ සමූපකාර සමිති වීම, ශ්‍රී ලංකාවටත් කදිම ආදර්ශයක්.